# මැදගම ප්‍රාදේශීය සභාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජූලි 24 දිනද ,ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 ජූනි 03 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 නොවැම්බර් 19 දින සභාවේ සභාපති වරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මැදගම ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට මැදගම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.20,503,506 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,948,773 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,273,526 ක් විය.

### 2.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශණයෙහි අගයන් හා අයවැය ගත අගයන් සැසඳීමේදී කුලී මුදල්, වරිපනම් බදු, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු, වරෙන්තු ගාස්තු හා දඩ යන ආදායම් ශීර්ෂයන්ගේ 40% සිට 291% දක්වාද , ගමන් වියදම්, ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු යන වැය විෂයයන්ගේ 29% සහ 45% ක විචලනයන්ද නිරීක්ෂණය විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) | වරිපනම් හා බදු | 267 | 193 | 626 |
| (ii) | බදු කුලී | 4,154 | 4,245 | 1,320 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 674 | 674 | - |
| (iv) | වෙනත් ආදායම් | 13,732 | 13,686 | 796 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 1,912,795 |
| (ii) | මුද්දර ගාස්තු | 598,945 |

2.4 නිශ්ක්‍රීය භෞතික සම්පත්

රු.650,000 ක් වටිනා කැබ් රථයක් හා රු.10,000 ක් වටිනා අනු පිටපත් යන්ත්‍රයක් නිශ්ක්‍රීයව පවතින බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.1,000,348 ක් වූ අතර, අවුරුද්දක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.928,348 ක් විය.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබුණ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.274,703 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.5,262,818 ක් වූ හිඟ ආදායම් අයකරගෙන නොතිබුණි.

(ඈ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණ මණ්ඩලයක් මගින් පරීක්ෂා කරවීමට කටයුතු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂෙත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර පාලනය

(ආ) ආදායම් පරිපාලනය